**මාර්ග ජාල වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය-2011**

---------------------------------------------------

1. **මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැරුනු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, 2011 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මුල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව, සහ

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බවත්ය.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මූල්‍ය කාර්ය සාධනය

----------------------

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම රු.33,379,753 ක් වූ අතර 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.17,546,380,192 ක් විය. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| විස්තරය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2011 | 2010 | |
| | රු. | රු. | රු. |
| ස්ථාවර වත්කම් - ලියාහල අගය (මාරු කළ අගය) | (179,599) | (844,843) | 12,435 |
| සම්පූර්ණ කළ සිවිල් වැඩ | 131,711,746 | 212,479,214 | 14,138,782,303 |
| කෙරගෙන යන වැඩ | - | - | 130,619,771 |
| ව්‍යාපෘති පරිපාලනය | 18,560,055 | 19,505,840 | 3,230,190,330 |
| ඉඩම් අත්කර ගැනීම් | 2,036,203 | 3,278,394 | 65,173,392 |
| ශුද්ධ ජංගම වත්කම් | (118,748,652) | - | (18,398,039) |
| | 33,379,753 | 234,418,605 | 17,546,380,192 |

## 2.2 අග්‍රිම අරමුදල

2009 අප්‍රේල් 30 දින දක්වා මෙම ව්‍යාපෘතිය යටතේ අග්‍රිම අරමුදල් ගිණුම් දෙකක් ක්‍රියාත්මකව පැවතුණි. එදිනෙන් පසු විදේශ අරමුදල් කිසිවක් ලැබී නොතිබුණු අතර එදින සිට අග්‍රිම අරමුදල් ගිණුම්වල කිසිදු ශේෂයක් නොපැවතුණි.

## 3. විගණන නිරීක්ෂණ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය එහි කටයුතු නිම කර අග්‍රිම පියවීම් සඳහා කාලය 2009 අප්‍රේල් 30 දිනෙන් අවසන් කර තිබුණු නමුත් ව්‍යාපෘති කාලය තුළදී රු.62,425,145 ක පිරිවැයකට මිලදී ගෙන තිබුණු ස්ථාවර වත්කම් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මාරු කිරීමට ව්‍යාපෘතිය විසින් පියවර ගෙන නොතිබුණි. තවද, රු.13,189,007 ක් වටිනා ව්‍යාපෘතියේ සමහර ස්ථාවර වත්කම් ව්‍යාපෘතියේ කටයුතු වලට කිසිදු ඍජු සම්බන්ධතාවයක් නොමැති ආයතන භාරයේ පැවති බව නිරීක්ෂණය විය.

(ආ) මාර්ග සංවර්ධන අධිකාරියේ බස්නාහිර පළාත් අධ්‍යක්ෂ කාර්යාලයට ලබා දුන් රු.300,000 ක අත්තිකාරමක් හා විදේශ ගමනක් සඳහා ලබා දුන් රු.233,500 ක් වූ වෙනත් අත්තිකාරමක් වර්ෂ දෙකක කාලයක් තිස්සේ නිරවුල් නොකර පැවතුණි. තවද, 2008 දී කොන්ත්‍රාත්කරුවන් හත් දෙනෙකු විසින් සම්පූර්ණ කරන ලද කොන්ත්‍රාත් සම්බන්ධයෙන් වූ එකතුව රු.229,066 ක්වූ රඳවා ගත මුදල් නිදහස් කිරීමට හෝ ආදායම ලෙස සැලකීමට පියවර නොගෙන වර්ෂ 3 කට වැඩි කාලයක් ගිණුම්වල රඳවාගෙන තිබුණි. ඊට අමතරව, එකතුව රු.120,617 ක් වූ උපචිත වියදම් වර්ෂ 3 කට වැඩි කාලයක් ගිණුම්වල පරිශේෂව පැවතුණි.

(ඇ) ව්‍යාපෘතියේ සිවිල් වැඩ සඳහා ආරම්භක ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 9,564 කට සමාන වි.ගැ.හි මිලියන 35.48 ක් වූ අතර ඒ අතුරින් රු.මිලියන 6,933 කට සමාන වි.ගැ.හි මිලියන 25.19 ක් මූල්‍යනය කිරීමට ණය දෙනු ලබන නියෝජිතායතනය එකඟ වී තිබුණි. කෙසේවෙතත්, අමතර වැඩ සහ මිල වෙනස් වීම් හේතුවෙන් 2011 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ සිවිල් වැඩ සඳහා වූ තථ්‍ය පිරිවැය රු.මිලියන 17,578 ක් දක්වා ඉහළ ගොස් තිබුණි. ඒ අනුව, නැවත වෙන්කිරීම් සිදු කිරීමෙන් අනතුරුව සිවිල් වැඩ සඳහා ණය මුදල රු.මිලියන 9,629.06 කට සමාන වි.ගැ.හි 46.19 ක් දක්වා ඉහල ගොස් තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විට රජයේ දායකයද රු.මිලියන 7,949 ක් දක්වා ඉහල ගොස් තිබුණි.

(ඇ) කටුගස්තොට කුරුණෑගල මාර්ගය ඒ.ඒ.010 (කි.මී. 37.8) හා කටුගස්තොට - වත්තේගම මාර්ගය බි 205/369 (කි.මී. 9.8) හැර ව්‍යාපෘතිය යටතේ වූ සියළුම මාර්ග ඉදිකිරීම් වැඩ 2008 දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණ කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කොන්ත්‍රාත්කරු පෙන්වා තිබුණු මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් කටුගස්තොට - කුරුණෑගල මාර්ගය ඒ ඒ 010 (කි.මී.37.8) හා කටුගස්තොට - වත්තේගම මාර්ගය බි 205/369 (කි.මී. 9.8) පුනරුත්ථාපනය කිරීම සඳහා වූ රු.1,088,612,328 ක් වටිනා කොන්ත්‍රාත්තුව චීන සමාගමක වෙත පවරා තිබුණු අතර සිවිල් වැඩ සංරචකය යටතේ වූ වැඩවල විෂය පථය, විචලන නියෝග හා ප්‍රමාණ පත්‍රවල වෙනස් කිරීම් යටතේ සංශෝධනය කර තිබුණි. ඒ අනුව, මුල් කොන්ත්‍රාත් වටිනාකම රු.553,387,762 කින් පසුව වැඩි කර තිබුණි. 2010 වර්ෂයේදී කටුගස්තොට - වත්තේගම මාර්ග කොටස (කි.මී. 9.8) මුල් කොන්ත්‍රාත්කරුගෙන් සම්පූර්ණයෙන්ම ඉවත්කර තිබුණු අතර පසුව එය වෙනත් කොන්ත්‍රාත්කරුවකුට භාරදී තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර වර්ෂ හයක කාලයක් ඉක්මවා තිබුණු නමුත් කටුගස්තොට - වත්තේගම මාර්ගයේ පුනරුත්ථාපන වැඩ සම්පූර්ණ කර නොතිබුණි.

(ii) ලැබී තිබුණු තොරතුරු අනුව, කටුගස්තොට - කුරුණෑගල මාර්ගයේ ඒ ඒ 010 කි.මී.03+100 සිට කි.මී. 14+160 කොටසේ ඉතිරි වැඩ කොටස් මාර්ග සංවර්ධන අධිකාරියේ මධ්‍යම පළාතේ පළාත් අධ්‍යක්ෂ වරයාගේ අධීක්ෂණය යටත් සිදු කිරීමට මහනැගුම ඉදිකිරීම් උපකරණ සමාගමට භාරදී තිබුණි. පළාත් අධ්‍යක්ෂවරයාට අනුව 2011 දෙසැම්බර් 31 දිනට පුනරුත්ථාපන වැඩ වලින් 60% ක් සම්පූර්ණ කර තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත් ගිවිසුමේ පිටපත විගණනයට ලැබී නොතිබුණු අතර කොන්ත්‍රාත්තුවේ මුළු අගය සහ වැඩ සම්පූර්ණ කිරීමට නියමිත දිනය විගණනයේදී තහවුරු කළ නොහැකි විය.

(ඉ) ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු පිළිබඳ නිසි ක්‍රියාකාර සැලැස්මක් පිළියෙළ කර නොතිබුණු අතර ඒ අනුව, එම කටයුතු සම්පූර්ණ කිරීම සඳහා වන කාලය හා ඒ මත දැරීමට අපේක්ෂිත පිරිවැය විගණනයේදී නිගමනය කිරීමට නොහැකි විය. කෙසේ වෙතත්, ඉඩම් අත් කර ගැනීම නියමිත දිනවලදී සම්පූර්ණ කර නොතිබුණි. ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2001 සැප්තැම්බර් 03 දිනැති ලිපිය මගින් මාර්ග සංවර්ධන අධිකාරිය , ප්‍රාදේශිය ලේකම්වරුන්ට ලබා දුන් උපදෙස් ප්‍රකාරව, 2002 පෙබරවාරි 28 දිනට පෙර සියළුම වන්දි ගෙවීම් සම්පූර්ණ කළ යුතුය. කෙසේ වෙතත්, 2011 දෙසැම්බර් 31 වන විට ඉඩම්

කොටස් 10,721 ක් වෙනුවෙන් එකතුව රු.147,158,366 ක් වූ වන්දි ගෙවීම් ප්‍රමාද වීම මත පොලී ගෙවා තිබුණි. ඒ අනුව, ව්‍යාපෘතියේ අමතර පිරිවැය වැළැක්විය හැකි වන පරිදි වන්දි ගෙවීම් නිරවුල් කිරීමට අර්ථවත් පියවර ගෙන නොතිබුණි.

(ii) ලැබී තිබුණු තොරතුරු අනුව, පහත සඳහන් මාර්ගවල පනරුත්ථාපන වැඩ සඳහා අත්කරගත් ඉඩම් කොටස් 153 ක් සඳහා වන්දි ගෙවීම් කටයුතු 2011 දෙසැම්බර් 31 වනවිටත් සම්පූර්ණ කර නොතිබුණි.

| **මාර්ගය** | <u>**2011 දෙසැම්බර් 31 දිනට වන්දි නිරවුල් කිරීම මත ආරවුල් පැවති ඉඩම් කොටස් ගණන**</u> |
|---|---|
| කටුගස්තොට - කුරුණෑගල මාර්ගය | 118 |
| කටුගස්තොට - වත්තේගම මාර්ගය | 14 |
| පානදුර - ඉංගිරිය මාර්ගය | 05 |
| පස්යාල - මීරිගම මාර්ගය | 07 |
| අම්බලන්ගොඩ - ඇල්පිටිය මාර්ගය | <u>09</u> |
| **එකතුව** | <u>153</u> |

## 4. ව්‍යාපෘති කටයුතු අවසන් කිරීම

----------------------------------

මෙම වාර්තාවේ 5 (ඇ) ඡේදයේ විස්තර කරන ලද වැඩ හැර, ණය මුදල් මගින් ඉටු කිරීමට නිශ්චය කළ ව්‍යාපෘති කටයුතු 2008 වර්ෂයේදී සම්පූර්ණ කර තිබුණු අතර 2009 අප්‍රේල් 30 දිනට පෙර සුදුසුකම් ලත් සියළු වියදම් අයදුම් කර ලබා ගෙන තිබුණි. තවද, 2009 මැයි මාසයේදී උපදේශකවරුන් විසින් ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමේ වාර්තාව ඉදිරිපත් කර තිබුණි. කෙසේවෙතත්, ක්‍රියාත්මක කරවන නියෝජිතායතනය වශයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය , ව්‍යාපෘතියේ ගිණුම් අවසන් කිරීමට හා අදාල පාර්ශවයන් වෙත වත්කම් භාරදීමට පියවර ගෙන නොතිබුණි.